**ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය - 2025**

-----------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනයේ 2025දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, අරමුදල් හා සංචිත වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 අංක 03 දරන ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතන (සංස්ථාගත කිරීමේ) පනතේ 10(3) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ආයතනයේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.

සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකබව මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- ආයතනය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව. | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2014 අංක 03 දරන ශ්‍රී ලංකා හු විද්‍යා පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව 2016 මාර්තු 21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත්කරන ලද රීතිවල 2 වන ඡේදය හා එහි 22 වන ඡේදයහි 2 (xi) | ආයතනයේ ලියාපදිංචි කාර්යාලය ස්ථාපිත කිරීම, පාලනය සහ පවත්වාගෙන යාමෙහි අවශ්‍යතාවය සඳහන් කර ඇතත්, ශ්‍රී ලංකා හු විද්‍යා ආයතනය සඳහා ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම ස්ථිර ලිපිනයක් සහිත කාර්යාලයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මේ පිළිබඳව සාකච්ඡා කරමින් පවතී. | ශ්‍රී ලංකා හු විද්‍යා පනත ප්‍රකාරව ආයතනයේ ලියාපදිංචි කාර්යාලයේ ස්ථාපිත කොට පවත්වාගෙන යායුතුය. |
| (ආ)ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 395(ආ) සහ (ඇ) රෙගුලාසි | බැංකු ගිණුමක් ඇති සෑම ආයතනයක් විසින්ම එක් එක් මාසය අවසානයේදී ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කල යුතු වුවත් ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශ 2015 වර්ෂයේ සිට පිළියෙල කර නොතිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී බැංකු සැසඳුම් පිළියෙල කිරිමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව බැංකු සැසඳුම් පිළියෙල කිරිමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.909,324 අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,371,072 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.461,748 ක පිරිහීමක් නිරීක්ෂණය විය.2024 වර්ෂයට සාපේක්ෂව අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහනේ ආදායම අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 අනුපාත විශ්ලේෂණය**

සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය 60:1 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එම අනුපාතය 84:1 විය. 2023 වර්ෂයේ ජංගම අනුපාතය 101:1 වුයෙන් මෙම අනුපාතයේ ක්‍රමික පිරිහීමක් නිරීක්ෂණය විය.

සමාලෝචිත වර්ෂයේ ක්ෂණික අනුපාතය 59:1 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එම අනුපාතය 83:1 විය. 2023 වර්ෂයේ ක්ෂණික අනුපාතය 100:1 වූයෙන් මෙම අනුපාතයේද ක්‍රමික පිරිහීමක් නිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයේ ආයතනයේ මුළු සාමාජිකයින් 219 ගෙන් රු.1,152,500 ක් වූ සාමාජික ගාස්තු අය විය යුතු වුවත් එම සාමාජික ගාස්තු වලින් සියයට 60 ක් එනම් රු.690,500 ක් අය කර ගෙන නොතිබුණු අතර සාමාජිකයන්ගෙන් අයවිය යුතු හිඟ මුදල් ප්‍රමාදයකින් තොරව අයකර ගැනීම සඳහා කාර්යක්ෂම ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | මෙම රාජකාරිය සිදු කිරීම සඳහා නිලධාරියෙකු අනුයුක්ත කර නොමැති අතර සාමාජික ලේඛනය සහ ගිණුම් පරිගණක පද්ධතියක් හරහා සිදුකරගෙන යාමට කටයුතු සිදුකරමින් පවතී. | සාමාජිකයන්ගෙන් අයවිය යුතු හිඟ මුදල් ප්‍රමාදයකින් තොරව අයකර ගැනීම සඳහා කාර්යක්ෂම ක්‍රමවේදයක් ඇති කළ යුතුය. |
| (ආ) | 2019 වර්ෂයේදී මිලදීගෙන තිබුණු අවසන් තොගයෙහි ඇතුළත් රු.99,750 ක් වටිනා ටී ෂර්ට් 133 ක් වසර 6 ක කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණු අතර ආයතනය සතු තොග වර්ෂාවසාන දිනට භෞතිකව සත්‍යාපනය කළ යුතු වුවත් සාමාජිකයන් වෙත අලෙවි කිරීමේ අරමුණින් මිලදීගත් ටී ෂර්ට් තොගය හා නිල මුද්‍රා 12 ක් සත්‍යාපනයකින් තොරව හා ගිණුම් යාවත්කාලීන කිරීමකින් තොරව පවත්වාගෙන ගොස් තිබුණි. | වාර්ෂික රැස්වීමේදී පාලක මණ්ඩලය සමඟ සාකච්ඡා කර මේ පිළිබඳව තීරණයක් ගැනීමට කටයුතු කරනු ලබන අතර ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ආයතනයේ අවශ්‍යතාවය මත මිලදී ගැනීම් සිදු කල යුතු අතර කල් පසුවූ තොග සුදුසු පරිදි භාවිතයට ක්‍රමවේදයක් සැකසිය යුතුය. |

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය විසින් භූ විද්‍යාඥයින් සඳහා පවත්වාගෙන යනු ලබන සාමාජික ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | මෙම රාජකාරිය සිදු කිරීම සඳහා නිලධාරියෙකු අනුයුක්ත කර නොමැති අතර සාමාජික ලේඛනය සහ ගිණුම් පරිගණක පද්ධතියක් හරහා සිදුකරගෙන යාමට කටයුතු සිදුකරමින් පවතී. | සාමාජික ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යා යුතුය. |

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික වාර්තාව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාවක් සෑම මුදල් වර්ෂයක් සඳහාම සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශ සමඟ අදාළ වසරට පසුව එන වර්ෂයේ සය මාසයක් ඉකුත් වීමට පෙර පරිසර විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත හා | මේ සම්බන්ධව අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරමින් පවතී. | පනත ප්‍රකාරව වාර්ෂික වාර්තා සකස් කර අදාල ආතන ව්‍යුහයන් වෙත ඉදිරිපත් කළ යුතුය. |

ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2022, 2023 හා 2024 වර්ෂයන්ට අදාළ වාර්ෂික වාර්තා 2026 මැයි මස අවසන් වන විටද ඉදිරිපත් කර නොතිබුණි.

## 4.2 අරමුණු සහ සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අදාළ කාලපරිච්ඡේදය තුළ අත්පත් කර ගත යුතු ඉලක්ක සහ අරමුණු හඳුනාගනිමින් ආයතනයේ සංයුක්ත සැලැස්ම පිළියෙළ කළ යුතු අතරම සෑම වසරකම එය යාවත්කාලීන කළ යුතු වුවත් 2024-2028 වර්ෂ සඳහා සකස් කරන ලද සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණි. | මෙම සංයුක්ත සැලැස්ම 2025 වාර්ෂික මහා සභා රැස්වීමට ඉදිරිපත් කළ අතර එහිදී සාමාජිකත්වයේ එකඟතාවය මෙම සැලැස්මට ලැබුණි. | සෑම වසරකම ආයතනික සැලැසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය. |

## 4.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ අරමුණු කරගත් ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අදාළ වර්ෂය තුළ වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම්, එම ක්‍රියාකාරකම් තාර්කික අනුපිළිවෙළක් හා විස්තරාත්මකව ලැයිස්තුගත කිරීමත්, සාක්ෂාත් කරගත යුතු අරමුණු සමඟ ක්‍රියාකාරකම් සම්බන්ධ කිරීමත් සහ එක් එක් ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය ඇස්තමේන්තු ඇතුලත්ව සංයුක්ත සැලැස්මට අනුව හඳුනාගත් ඉලක්කයන් අදාළ වර්ෂය තුළ කවර කාල පරාසයකදී ළඟා කර ගත හැකිද යන්න ඇතුලත් කර ක්‍රියාකාරී සැලැස්මක් සැකසිය යුතු වුවත් 2025 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරමු. | වර්ෂය තුළ ළඟා විය හැකි ඉලක්ක හඳුනාගෙන ඊට අදාල ක්‍රියාකාරකම් සැලැස්මක් සකස් කළ යුතුය. |